**ආහාර බෝග - 2**

# රස ගුණ වඩන 'කුළු බඩු' වගාව

ආහාරය රසවත් කරන්නට කුළු බඩුවලට ඇත්තේ අපූරු හැකියාවකි. ඒ ඒ ආහාර සඳහා අඩු වැඩි වශයෙන් කුළු බඩු යොදා ගන්නද, එය ආහාර සඳහා අත්‍යවශ්‍යම අංගයකි. කුළු-බඩු නොමැති කල කටට රහට ආහාර පිළියෙල කිරීම ද ප්‍රශ්නයක් වනු ඇත.

කුළු බඩු යහමින් යොදා රසවත් ආහාර සැකසීමට ශ්‍රී ලාංකික ගෘහණියන් කවදත් සමර්ථය. මුළු තැන්ගෙයි නැතිවම බැරි ද්‍රව්‍යයක් වන්නේද කුළු බඩුය. කුළු බඩුවල අන්තර්ගතව ඇති රසායනික සංයුතිය නිසාම එහි සැර ගතිය ඇති වන බව පවසන ක්ෂුද්‍ර විද්‍යාඥයන්, ක්ෂුද්‍ර ජීවීන් ඇති වීම වැළැක්වීමේ හැකියාවක් ඊට පවතින බවද පෙන්වා දෙයි.

කුළු බඩු බෝග යටතේ මෙවර මිරිස්, රතුලූණු හා ලොකු ලූණු පිළිබඳ විමසා බලමු.

### මිරිස්

මිරිස් හුදු බෝගයක්ම පමණක් නොව මෙරට සංස්කෘතියේම කොටසකි. එහි ඇති දැවිලි ගතියත්, රසකාරක බවත් නොවන්නට කිසිදු ආහාරයක් සම්පූර්ණ නොවේ. වියළි කලාපයෙහි බහුලව වැවෙන මිරිස්, මුදල් උපයාදෙන වැදගත් බෝගයකි.

සමස්ත මිරිස් නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් සැපයෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙනි. මුහුදු මට්ටමේ සිට මීටර 1600 ක් උස් ප්‍රදේශය දක්වා වගා කළ හැකි වුවද වියළි කලාපය තරම් සුදුසු පරිසරයක් එයට නොමැත.

මිරිස් වගාව සඳහා නිර්දේශිත ප්‍රභේද සතරකි.

**(1) එම්. අයි. - 1**

සාමාන්‍ය සැර ගතියකින් යුතු මෙම ශාකය සෙන්ටි මීටර 75 - 100 ත් දක්වා උසට වැවේ. සෙන්ටි මීටර 9 - 12 අතර දිගු කරල් සෑදේ.

**(2) එම්. අයි. - 2**

යල කන්නයේදී අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 2.5 සිට 3.5 දක්වාද, මහ කන්නයේදී හෙක්ටයාරයකට 1.5 සිට 2 දක්වා ලබාගත හැකියි.

උස සෙන්ටි මීටර 36 ක් 48 ක් වන මෙය කෙටි ශාකයකි. වියළි මිරිස් නිෂ්පාදනයට උචිතය.

**(3) කේ. ඒ. - 2**

තියහයට යම් තරමකින් ඔරොත්තු දෙන මෙය එම්. අයි. - 2 ප්‍රභේදය මෙන් යල හා මහ කන්නවලදී අස්වැන්න ලබා දෙයි. වියළීමට ඇති අපහසුවත්, ඇන්ත්‍රැක්නෝස් රෝගයට ගොදුරු වීම නිසාත්, මෙම වර්ගය යල කන්නයේදී වියළි මිරිස් නිෂ්පාදනයට සුදුසු ය. ශාකය අතු විසිරුණු ස්වභාවයක් දරන අතර උස සෙන්ටි මීටර 40 සිට 45 අතර ප්‍රමාණයකට වැඩෙයි.

**(4) අරුණළු**

තියහයකට තරමක් ඔරොත්තු දෙන මෙහි කරල සෙන්ටි මීටර 8 ත් 11 ත් පමණ දිගින් යුක්තය. කඳ සිහින්ය. උස සෙන්ටි මීටර 40 ත් 50 ත් අතර වේ. මෙහි අස්වැන්න ද එම්. අයි. - 2 හා කේ. ඒ. - 2 ප්‍රභේද මෙනි.

ලංකාවේ වැවෙන මිරිස් වර්ග කිහිපයකි. හීන්, බටු, වන්නි, කොච්චි, සුදු කොච්චි, පෙට්ටි, මල, මාලු වැනි වර්ගවලට



මිරිස්

මිරිස් අයත් වෙයි. ආහාර සඳහා වියළි හා අමු ලෙස මිරිස් භාවිත කෙරෙයි.

අවශ්‍ය තරමට කාබනික පොහොර යොදා ගත් ගැඹුරු, හොඳින් ජලය බැස යන සරු ලෝම පස මිරිස් වගාවට යෝග්‍ය ය.

වැටිවල හෝ උස් පාත්තිවල හෝ බෙසම් ක්‍රමයට හෝ පැළ සිටුවීම කළ හැකිය. ජල සම්පාදනයෙන් වගා කරන විට වැටි හෝ පේළි දෙකේ හෝ පාත්ති සුදුසුය. හෙක්ටයාරයකට බීජ කිලෝ ග්‍රෑම් එකක් අවශ්‍යය. මහ කන්නයේදී වැහි වතුරෙන් වගා කරන්නේ නම් වර්ෂාව ආරම්භයත් සමඟ සිදු කළ යුතු අතර ජල සම්පාදනයෙන් වගා කරන්නේ නම් වැස්සෙන් අනතුරුව දෙසැම්බර් මස වගා කළ යුතුය. යල කන්නයේදී නම් අප්‍රේල් මස මුල් සති දෙක අගනේය.

මිරිස් වගාව සඳහා වැඩි වශයෙන් මහන්සි වීම අනවශ්‍ය වන අතර විශාල තාක්ෂණයක් ද අවශ්‍ය නොවේ. හිරු එළිය හා පස සාරවත් බව ඔස්සේ දෛනික කාර්යක් ලෙස මිරිස් වගාවට සාත්තු කළ යුතුය. ශක්තිමත් බීජ පැළයක් සිටුවීමෙන් සාර්ථකව වගා කළ හැකිය. හෙක්ටයාරයකට මීටර 3 ක් දිග සෙන්ටි මීටර 90 ක් පළල පාත්ති 30 ක් අවශ්‍යය. පිළිස්සීමෙන් හෝ සූර්යෝෂ්ණීකරණය මගින් තවාන් පාත්ති ජීවාණුහරණය කිරීමෙන් පසු ඉක්මනින් බීජ සිටුවිය යුතුය. රෝග කාරක පාත්තිය ආක්‍රමණය කිරීම මෙයට හේතුවයි. බීජ දැමීමට පෙර 80% කැප්ටාන් ග්‍රෑම් 4 ක් බීජ කිලෝ ග්‍රෑම් 10 හෝ තිරාම් ග්‍රෑම් 4.5 කට හෝ භාවිත කළ හැකිය.

පැළ සිටුවීමට දින 7 කටත් 10 කටත් අතර පෙර සිටම තවානට සපයන ජලය සීමාකර, පැළ දැඩි කළ යුතුය. තවානේ බීජ දමා දින 30 - 35 කදී එනම් ස්ථිර පත්‍ර 5 ත් 7 ත් කාලයේදී පැළ සිටුවීම යෝග්‍යය. එක වලක පැළ දෙක බැගින් සිටුවිය යුතුය. පළමු මාස දෙකේදී දින 4 - 5 කට එක් වරක් බැගින්ද පසුව සතියකට වරක් බැගින්ද ජලය සැපයිය යුතු ය. පාත්දර හෝ සවස හෝ ජලය යෙදිය යුතු අතර ජලය සැපයිය යුතු ප්‍රමාණය වර්ෂාපතනය අනුව වෙනස් වේ. ඇලක්ලෝර් නමැති වල් නාශකය යොදා ගන්නේ නම් සති 3 ත් 4 ත් දක්වා කලක් වල් මර්දනය වේ. ඉන්පසු අතින් වල් නෙලිය යුතුය.

කොළ පුල්ලි ඇන්ත්‍රැක්නෝස්, පාදස්ථ කුණුවීම බැක්ටීරියානු මැලවීම, වෛරස් වැනි රෝගවලට මිරිස් ශාක ගොදුරුවන අතර කොළ කොඩවීම, පැළ මැක්කාගේ හානිය, කුඩිත්තාගේ හානිය, මයිටාවන්ගේ හානිය, සුදු මැස්සාගේ හානිය, කරල් විදින දළඹුවාගේ හානිය යන කෘමි උවදුරු වලට ලක්වේ. සිටුවා දින 70 ත් 80 ත් අතර කාලයේදී අස්වැන්න නෙලීම ආරම්භ කළ යුතුය. මිරිස් කරලෙන් 80% ක් පමණ රත් පැහැ ගැන්වුණු කරල් පමණක් නෙලා ගත යුතුය.

මුළුතැන්ගෙයි නැතිවම බැරි දෙයකි ලූනු. දැසට කඳුළු

තංවමින් ගෘහණිය කපා දමන ලූනු ඉන්දිය හා චීන ආහාරවලට මනා රසයක් සපයයි. නූතන ලෝකයේ ප්‍රතිජීවක හා ඖෂධ සඳහා ලූනු භාවිත කරයි. උපරිම පෝෂණ ගුණය සඳහා ලූනු අමුවෙන් කෑ යුතුය. රටේ ආර්ථික දේහයට කිසියම් සවියක් ලූනු මගින් ලැබෙන නිසා එය පවත්වාගෙන යෑමට ණය පහසුකම් දීමට රජය ක්‍රියා කරයි.




## රතුලූනු -

වියළි දේශගුණයට හොඳින් හුරු රතු ලූනු මුහුදු මට්ටමේ සිට අඩි 2000 දක්වා වූ බිම් ප්‍රදේශවල හොඳින් වැවේ. ඇලියේසි නම් ශාක කුලයට අයත්වන රතුලූනු සඳහා අප රටේ පවතින්නේ විශාල ඉල්ලුමකි. යාපනය, මුලතිව්, ත්‍රිකුණාමලය, පුත්තලම හා මඩකලපුව වැනි දිස්ත්‍රික්කවල රතුලූනු වගාව සිදුවේ. මෑතක සිට රත්නපුරය, හම්බන්තොට, අනුරාධපුරය, මොණරාගල හා බදුල්ල වැනි දිස්ත්‍රික්කවෙත ද මෙම වගාව ව්‍යාප්තව ඇත.

දැනට මෙරටෙහි බහුලව වගා කරන රතුලූනු ප්‍රභේද දෙකකි.

(1) යාපනය දේශීය වර්ගය

(2) වේදලන්

හොඳින් කාබනික ද්‍රව්‍ය අඩංගු වැලි, ලෝම් පස වගාවට උචිතය. යෝග්‍යතම පී. එච්. අගය වූ 6.0 - 7.3 පසෙහි තිබීම වගාව සඳහා හිතකරය. රතුලූනු වගාව සඳහා ඉඩමෙහි බිම පෙරළා, වල් පැළ ගල්කැට ඉවත්කර සෙන්ටි මීටර් 75 ක් පළල, මීටර් 3 ක් දිග, සෙන්ටිමීටර් 15 ක් උසැති පාත්ති සකසා පාත්ති දෙකක් අතර සෙන්ටි මීටර 30 ක් පමණ පළල කාණු සකසා ගත යුතුය.

මහ කන්නයේදී වැහි වතුරෙන් ද (සැප්තැම්බර් - දෙසැම්බර්) ජල සම්පාදයෙන් දෙසැම්බර් මැද හා ජනවාරි මැද දී ද, යල කන්නයේදී වැහි වතුරෙන් ද (මාර්තු - අප්‍රේල්) ජල සම්පාදනයෙන් මැයි, ජූලි මැද දී ද වගාව ආරම්භ කළ හැකිය.

මේ වන විට රතුලූනු නිෂ්පාදන ධාරිතාව මෙට්‍රික් ටොන් 44,410 කි. 2005 වන විට එය මෙට්‍රික් ටොන් 73,500 දක්වා වැඩි විය යුතුය. සති 8 ත් 10 ත් අතර කාලයක් ගබඩා කර තබාගත් නිරෝගී බල්බ, සිටුවීමට යොදා ගත යුතු අතර සිටුවීමට පෙර දිලීර නාශක ද්‍රාවණයක ගිල්වා තැබීම වැදගත්ය. බල්බවල ඉහළ කෙළවර යමනමින් පස මතු පිටට පෙනෙන සේ සෙන්ටි මීටර 10×10 හෝ 8×8 පරතරය ඇතිව සිටු විය යුතුය.

බල්බ සිටුවා සති 2, 4, 6 දී වල් පැළෑටි ගලවා දැමීම වැදගත්ය. අනතුරුව රසායනික පොහොර යොදා ගත යුතුය. බල්බ සිටුවීමට පෙර පාත්තිවලට ජලය සැපයිය යුතු අතර පළමු මස දී දින 2 - 3 වරක් ද, ඉන් පසු දින 4 - 6 වරක් බැගින් ද ජලය සැපයිය යුතුය.

බල්බ කුණුවීම, පත්‍ර දහර රෝගය, දළු පැල්ලම් රෝගය, යටි පුස් රෝගය, සඳහාත්, පැළ මැක්කා, ලූනු දළඹුවා යන කෘමි උවදුරටත් රතුලූනු පැළ ගොදුරු වෙයි. බල්බ සිටුවා දින 80 - 90 ත් අතර දී අස්වැන්න නෙලා ගත හැකි අතර මේරූ වගාවන්හි බල්බ ගලවා දින 2 - 3 පමණ වියළීම සඳහා තැබිය යුතු වේ. හෙක්ටයාරයකට ටොන් 8 - 12 පමණ අස්වැන්නක් රතුලූනු වගාවෙන් ලබාගත හැකිය. කාබනික ද්‍රව්‍ය යොදා හොඳින් නඩත්තු කළ වගාවකින් හෙක්ටයාරයකට ටොන් 20 ක අස්වැන්නක් ගත හැකිය.




**කුළු බඩු යහමින් යොදා රසවත් ආහාර සැකසීමට ශ්‍රී ලාංකික ගෘහණියන් කවදත් සමර්ථය. මුළු තැන්ගෙයි නැතිවම බැරි ද්‍රව්‍යයක් වන්නේද කුළු බඩුය. කුළු බඩුවල අන්තර්ගතව ඇති රසායනික සංයුතිය නිසාම එහි සැර ගතිය ඇති වන බව පවසන ක්ෂුද්‍ර විද්‍යාඥයන්, ක්ෂුද්‍ර ජීවීන් ඇති වීම වැළැක්වීමේ හැකියාවක් ඊට පවතින බවද පෙන්වා දෙයි.**

## ලොකු ලූනු -

දේශීය නිෂ්පාදනයේ අත්‍යවශ්‍ය බෝගයකි. වාර්ෂිකව ලොකු ලූනු අවශ්‍යාව මෙට්‍රික් ටොන් 90,000 කි. නමුත් මෙරටෙහි නිෂ්පාදන ධාරිතාව මෙට්‍රික් ටොන් 22,500 කි. අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 10 කි. වියදම කිලෝ ග්‍රෑමයකට රුපියල් 9.82 කි. මෙය මෙසේ වුවද 2005 දී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,14,800 දක්වා වැඩි කිරීමට ඉලක්ක කෙරෙන අතර එවිට අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 14 ක් වනු ඇත. කිලෝ ග්‍රෑමයකට වැයවන වියදම රුපියල් 7.20 දක්වා පහත වැටෙනු ඇත. නිර්දේශිත ප්‍රභේද කිහිපයකි.

1. පූසාරෙඩ්
2. රාම්පූර්
3. ඇග්‍රිෆවුන්ඩ ලයිට් රෙඩ්
4. කල්පිටිය වරණය
5. එන් - 53

වැලිලෝම හා වැලි මැටි ලෝම පස වගාවට උචිත වන අතර දිවා කාලය දිගුවීම හිතකරය. වගාව මුල් කාලයේදී හා අවසාන මාසයේදී පමණක් වියළි කාලයක් පැවතිය යුතුය.

හෙක්ටයාරයකට බීජ කිලෝ ග්‍රෑම් 7.5 සිට 8.5 දක්වා ප්‍රමාණයක් අවශ්‍යය. යල කන්නයේ අප්‍රේල් මැද සිට ජූනි අග දක්වා කාලය සිටුවීමට යෝග්‍යය. අධික වර්ෂාව හා වාතයේ දැඩි ජලවාෂ්ප නිසා මහ කන්නයේදී අධිකව රෝග වැළඳෙන අතර ගැඹුරට සීසා සකස් කළ පාත්තිවල තොමායි හෝ තිරාම් හෝ වැනි දිලීර නාශක ද්‍රාවණයක විනාඩි 5 - 10 අතර ගිල්වා තැබූ පැළ සෙන්ටිමීටර 8×8 හෝ 10×10 පතරනරයට සෙන්ටිමීටර් 1 - 1 1/2 පමණ ගැඹුරින් සිටවිය යුතුය.

මාර්තු මැද සිට අප්‍රේල් අග දක්වා තවාන් දැමීම සුදුසුය. හෙක්ටයාරයක් සිටුවීම සඳහා මීටර් 1×3 තවාන් පාත්ති 180 ක් අවශ්‍යය. බීජ දැමීමට පෙර පාත්ති මතුපිට පිදුරු දහයියා දමා පිළිස්සීමෙන්, සූර්යෝෂ්ණීකරණය මගින් හෝ නිර්දේශිත දිලීර නාශක මගින් හෝ පස ජීවානුහරණය කර නිරෝගී පැළ ලබාගත යුතුය.

පළමු මාස තුළ දින 2 - 3 කට වරක් හා ඉන්පසු දින 4 - 5 කට වරක් ජලය සැපයිය යුතු අතර අස්වනු නෙලීමට සති දෙකකට පෙර ජලය සැපයීම නැවැත්විය යුතුය.

පැළ මැක්කන්, ලූනු පත්‍ර දළඹුවා වැනි කෘමි උවදුරුවලට වගාව ගොදුරු වේ. යල කන්නයේදී රෝග ඇතිවීම අඩුය. පැළ සිටවා දින 90 - 100 ත් අතර කාලයකදී අස්වැන්න නෙලා ගත හැකිය. ❑

**ලබන කලාපයෙන් මාෂ බෝග පිළිබඳ බලාපොරොත්තු වන්න.**

සටහන -
**සමන්ත මල්ලවආරච්චි**
**තිළිණ රුවන් මලලසේකර**